// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1881/43 – 2014 සැප්තැම්බර් 26 වැනි සිකුරාදා – 2014.09.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### පඩිපාලක සභා ආඥාපනත

නිවේදනයයි

**රබර් වැවීමේ හා සැදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥා පනතේ 30 වැනි වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එම උපලේඛනයේ දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට රබර් වැවීමේ හා සැදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව යෝජනා කරන බව එකී පඩිපාලක සභා ආඥා පනතේ 29(3) වන වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණය 2014 ඔක්තෝබර් මස 01 දින සිට වලංගු විය යුතුය.

ඩබ්ලිව. ජේ. එල්. යූ. විජයවීර,
ලේකම්,
කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යාංශය.

2014 සැප්තැම්බර් මස 23 වැනි දින,
කොළඹ 05,
කම්කරු මහලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

රබර් වැවීමේ හා සැදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1945 ජූලි මස 31 වැනි දින අංක 9441 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* පළකරනු ලැබූ නිවේදනයෙහි උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූද, වරින් වර වෙනස් කරන ලද්දාවූද අවසන් වරට 2006.10.31 දින පළ කරන ලද අංක 1469/18 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* පලකරන ලද නිවේදනය මගින් වෙනස් කරන ලද්දාවූ ද තීරණ වල II වන කොටසේ අවම දෛනික වේතන ප්‍රමාණය වෙනුවට පහත සඳහන් කොටස අළුතින් ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතුය.

II වන කොටස

කාල මිම්මේ වැඩ සඳහා ගෙවිය යුතු අවම දෛනික වේතන ප්‍රමාණය

| | |
|---|---|
| කම්කරු | – රු. 405.00 |

10-491